Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 11 S I,II

නම: ............................................ | බුද්ධ ධර්මය | කාලය පැය දෙකයි

★ සැලකිය යුතුයි.
★ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
★ එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් හිමි වේ.
★ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

★ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්තව ඍජු ප්‍රතිපත්තියෙහි යෙදෙන බැවින් සංඝ රත්නය,
1. සුපටිපන්න වන සේක. 2. උජුපටිපන්න වන සේක.
3. ඤායපටිපන්න වන සේක. 4. සාමීචිපටිපන්න වන සේක.

02) භික්ෂූන් වහන්සේ විසින් ගිහියා කෙරෙහි ධර්ම දානයෙන් ප්‍රතිඋපකාර කළ යුතු යැයි බුද්ධ දේශනාවේ සඳහන් කරුණු සංඛ්‍යාත්මකව,
1. පහ කි. 2. හය කි 3. හත කි. 4. එකොළහ කි.

03) භද්දකච්චානා තෙරණිය පිරිනිවන් පාන්නට තීරණය කරනු ලැබුවේ බුදු හිමි,
1. විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ සිටියදී. 2. බේලුව නම් ගමෙහි වැඩ සිටියදී.
3. නාලක නම් ගමෙහි වැඩ සිටියදී. 4. චාපාල චෛතිය නම් ස්ථානයේ වැඩ සිටියදී.

04) බුදුරජාණන් වහන්සේ දෙවියන්ට පමණක් දේශනා කර ඇති සූත්‍ර ඇතුළත් වරණය වන්නේ,
1. මහා සමය සූත්‍රය, පරාභව සූත්‍රය, නන්දකෝවාද සූත්‍රය.
2. මහා මංගල සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය, පරාභව සූත්‍රය.
3. සිඟාලෝවාද සූත්‍රය, නන්දකෝවාද සූත්‍රය, මහා සමය සූත්‍රය.
4. පරාභව සූත්‍රය, මහා සමය සූත්‍රය, මහා මංගල සූත්‍රය.

05) සැවැත් නුවර විසූ චුල්ලකාල නම් උපාසකගේ කතා වස්තුව තුළින් ප්‍රකට වන්නේ,
1. අයහපත් මිතුරන් ආශ්‍රය තුළින් තමාද පිරිහීමට පත්වන බවයි.
2. වැරදි කිරීම තුළින් හෘද සාක්ෂිය අනුව තමා වැරදිකාරයකු වන බවයි.
3. ධර්මය ආරක්ෂා කරන්නා ධර්මය විසින් රකින බවයි.
4. අකුසල ක්‍රියා සිදු කිරීමෙන් එහි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බවයි.

★ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(සබරගමුව, අර්ථ, ඔක්කප්පන, විභව තණ්හාව, භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය)

06) බුද්ධාදි රත්නත්‍රය පිළිබඳ ඇති දිව්‍ය, බ්‍රහ්ම, මාර, මනුෂ්‍ය ආදි කිසිවෙකුටත් නොසෙල්විය හැක්කේ ................................................ සද්ධාව ය,

07) ශ්‍රී පාදස්ථානය පිහිටා ඇත්තේ ................................................ පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ය.

08) ආනාපානසති භාවනාව ප්‍රගුණ කිරීමේදී ගැහැණු දරුවන් ................................................ පර්යංකයෙන් සිටීම වඩාත් සුදුසු ක්‍රමය වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

09) භික්ෂුණීන් වහන්සේලාගේ විනය පවත්වා ගෙන යාමට අදාළ .............................................. පනවන ලද්දේ ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ඉල්ලීම අනුවය.

10) සියල්ල මරණයෙන් කෙළවර වේ යැයි සිතා මෙලොව හැකිතාක් සැප විඳීමට ඇති ආශාව ........................................... ලෙස හැඳින්වේ.

★ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

11) යසෝදරාවත යනු යසෝදරා දේවියගේ පතිභක්තිය ප්‍රකාශිත කාව්‍ය නිර්මාණයකි. ( )

12) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට වූවා සේ සලකා සතුටට පත්වීම උපේක්ෂාවයි. ( )

13) තෙවන ධර්ම සංගායනාවෙන් පසු තම්බපණ්ණියට වැඩම කරන ලද්දේ මහාදේව හිමි ඇතුළු පිරිසය. ( )

14) සිගාලක ගෘහපති පුත්‍රයාට බුදුන් වහන්සේ දේශනා කළ පරිදි උපයන ධනය විනාශ වන කරුණු සයකි. ( )

15) බුද්ධ දේශනාව අනුව දිළින්දන්ට ආර්ථික පහසුකම් නොසලසන විට දිළිඳුකම වැඩි වේ. ( )

★ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට "අ" තීරුවට ගැළපෙන ප්‍රකාශය "ආ" තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| "අ" කොටස | | "ආ" කොටස |
|---|---|---|
| 16) කර්මවාදියෙකි | ( ) | A අනවජ්ජ සැපය. |
| 17) දුසිරිත් නොකර සිටීම | ( ) | B පටිච්ච සමුප්පාදය. |
| 18) නිවන් මගට නමකි | ( ) | C සේව්‍ය සේවක යුතුකම්. |
| 19) ඉමස්මිං සති ඉදං හෝති | ( ) | D ජෛන මහාවීර තුමා . |
| 20) සෞඛ්‍ය පහසුකම් සලසා දීම | ( ) | E ඤාය. |

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

★ සැළකිය යුතුයි.
★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
★ පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද 02 සිට 07 දක්වා ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01) කෙටි පිළිතුරු සපයන්න.

i. පරිනිර්වාණ සමයේ දී බුදු හිමියන්ට වැළඳුණ රෝගය කුමක්ද ?
ii. යසෝදරා දේවියගේ දෙමාපියන් නම් කරන්න.
iii. "මිනිසත් බව දුර්ලභය" යන අදහස පාලියෙන් දක්වන්න.
iv. සීලයේ ප්‍රභේද දෙක සඳහන් කරන්න.
v. සතර අගතියට අයත් කරුණු අතුරෙන් දෙකක් ලියන්න.
vi. තෙරුවන් කෙරෙහි ඇති කරගන්නා නිසි පැහැදීම කුමන නමකින් හැඳින්වේ ද ?
vii. බුදු සසුනෙහි අග්‍ර ශ්‍රාවක දෙනම නම් කරන්න.
vii. බුදු දහමින් ප්‍රතික්ෂේප කර ඇති වෙළෙඳාම් අතුරෙන් දෙකක් ලියන්න.
ix. බෞද්ධ සිද්ධස්ථානයක පියගැට පෙළ පාමුල පිහිටි අර්ධ කවාකාර ගල් පඩිය කුමන නමකින් හැඳින්වේ ද?
x. කිසිදු සත්ත්වයකු නොමැරිය යුතු බවට මාඝාත ආඥාව පනවන ලද්දේ කවුද? (ලකුණු 2 x 10 = 20)

02) i. අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණක් බව දක්වන ගාථාව ලියන්න. (ලකුණු 02)
ii. අටලෝ දහම නිවැරදිව නම් කරන්න. (ලකුණු 03)
iii. එයින් කරුණු දෙකක් පිළිබඳව බුදු සිරිතෙන් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

03) i. බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳව දේශනා කළේ කාහට ද? (ලකුණු 02)
ii. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි.............." යන පාලි පාඨය ලියා දක්වන්න. (ලකුණු 03)
iii. කුසල ක්‍රියා දහය නම් කොට තිදොරෙහි බෙදා දක්වන්න. (ලකුණු 05)

04) i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව කුමක් ද? (ලකුණු 02)
ii. දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය හා සහභාගී වූ රහතන් වහන්සේලා ප්‍රමාණය සඳහන් කරන්න. (ලකුණු 03)
iii. දෙවන ධර්ම සංගායනාවෙන් ලැබූ ප්‍රතිඵල තුනක් සඳහන් කර එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05) i. සියලු ප්‍රාණීන්ගේ ජීවිතයේ සුරක්ෂිත බව තහවුරු කරන සිල් පදය කුමක් ද? (ලකුණු 02)
ii. සියලු ජීවීන් දඬුවමට බිය බවත්, ජීවිතයට ප්‍රිය බවත් දක්වන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)
iii. සියලු සතුන්ට ජීවත්වීමේ අයිතිය බුදු දහමින් ලබා දී ඇති ආකාරය නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 05)

06) i. පැරණි විහාරවල බිතු සිතුවම් ඇඳීම සඳහා මූලාශය වී ඇත්තේ මොනවා ද? (ලකුණු 02)
ii. පොළොන්නරු යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 03)
iii. බෞද්ධ සාහිත්‍ය කෘති පරිශීලනයෙන් මෙරට ජන ජීවිතය වෙනස් වූ ආකාරය පහදන්න. (ලකුණු 05)

07) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.
i. ගිහි පැවිදි යුතුකම්
ii. නීරෝගි බව උතුම් ලාභයයි
iii. සීලයෙහි ත්‍රිකෝටික පාරිශුද්ධිය
iv. සම්මා ආජීවය (ලකුණු 5 x 2 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**2024 - තෙවන වාර පරීක්ෂණය**

**9 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය**

**I කොටස**

01) 02 02) 02 03) 01 04) 04 05) 03 06) ඔක්කප්පන 07) සබරගමුව 08) අර්ධ

09) භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය 10) විභව තණ්හාව 11) ✔ 12) x 13) x 14) ✔

15) ✔ 16) D 17) A 18) E 19) B 20) C (ලකුණු 2 x 20 = 40)

**II කොටස**

01. i. ලෝහිත පක්ඛන්දිකා
ii. සුප්‍රබුද්ධ රජු හා අමිතා බිසව
iii. "දුල්ලභංච මනුස්සත්තං"
iv. චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය
v. ඡන්දය, ද්වේශය, භය, මෝහ
vi. (අවෙච්චප්පසාදය) ආකාරවතී ශ්‍රද්ධාව
vii. සැරියුත් හිමි හා මුගලන් හිමි
viii. අවි ආයුධ වෙළෙඳාම
සත්ත්ව වෙළෙඳාම
මස් මාංස වෙළෙඳාම
මත් ද්‍රව්‍ය වෙළෙඳාම
වස විස වෙළෙඳාම
ix. සඳකඩපහණ
ix. අමණ්ඩ ගාමිණි අභය රජු (ලකුණු 2 x 10 = 20)

02. i. ඵුට්ඨස්ස ලෝකධම්මේහි
චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං
ඒතං මංගල මුත්තමං (ලකුණු 02)

ii. • ලාභ - අලාභ
• යස - අයස
• නින්දා - ප්‍රශංසා
• සැප - දුක (ලකුණු 03)

iii. පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(12 පාඩම - 73... 75 පිටු) (ලකුණු 05)

02. i. සුභ මානවකයාට (ලකුණු 02)

ii. චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චේතයිත්වා
කම්මං කරෝති, කායේන වාචාය මනසා (ලකුණු 03)

iii. පරපණ නැසීමෙන් වැළකීම
සොරකම් කිරීමෙන් වැළකීම
කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම
} කය (කාය කම්ම)

බොරුකීමෙන් වැළකීම
කේලාම් කීමෙන් වැළකීම
රළු වචන කීමෙන් වැළකීම
හිස් වචන කීමෙන් වැළකීම
} වචනය (වචී කම්ම)

දැඩි ලෝභයෙන් වැළකීම
ද්වේශයෙන් වැළකීම
වැරදි දෘෂ්ටිවලින් වැළකීම
} සිත (මනෝ කම්ම) (ලකුණු 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04. i. වජ්ජි පුත්තක භික්ෂූන් විසින් ක්‍රියාත්මක කරගෙන එනු ලැබූ විනය විරෝධී දස වස්තුව (ලකුණු 02)

ii. • පැවැත් වූ ස්ථානය - විශාලා මහනුවර වාලුකාරාමය
• මූලිකත්වය - සබ්බකාමී මහ රහතන් වහන්සේ
• සහභාගී වූ රහතන් වහන්සේලා ගණන - රහතන් වහන්සේලා 700 නමකි. (ලකුණු 03)

iii. • දස වස්තුව විනය විරෝධී යැයි සංඝ සම්මුතියෙන් ප්‍රතික්ෂේප කිරීම.
• විනය නීති ලිහිල් නොකිරීමට පළමු ධර්ම සංගායනාවේදී ගත් තීරණය ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම.
• ශාසනික පැවැත්මට එරෙහි උපද්‍රව ඉවත් කර ශාසනික සම්ප්‍රදායට සංශෝධනයක් ඇති වීම.
• දස වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් මහා සාංඝික ලෙස වෙනම නිකායක් පිහිටුවා ගැනීම හා සංගීතියට මූලික වූ හා එකඟ වූ ශික්ෂාකාමී පැරණි භික්ෂු සම්ප්‍රදාය ථේරීය නමින් පෙනී සිටීම.

යන කරුණු අතුරින් 03 ක් නම් කොට විස්තර කර ඇති පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. i. පණ ඇති සතුන් මැරීමෙන් වැළකීම
(පාණාතිපාතා වේරමණී සික්කාපදං සමාදියාමි) (ලකුණු 02)

ii. සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ (ලකුණු 03)

iii. සත්ත්වයින්ගේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා බුද්ධ දේශනා ඇසුරින් ලබා දී ඇති උපදේශ පෙන්වා දෙමින් ලියන ලද පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න. (18 පාඩම 108 - 112 පිටු) (ලකුණු 05)

06. i. • ජාතක කථා
• බුද්ධ චරිතය
• ශාසන ඉතිහාසය (ලකුණු 02)

ii. • ධර්ම ප්‍රදීපිකාව හෙවත් මහා බෝධිවංශ පරිකථාව
• අමාවතුර
• මුවදෙව්දාවත
• සසදාවත (ලකුණු 03)

iii. • මෙරට ජනයා පිං පව් පිළිබඳ විශ්වාසයෙන් යුතුව ලැජ්ජා භය දෙකෙන් අනූනව හැඩගැසීම සිදුවීම.
• චින්තනය සමඟ දහමට යොමුවීම.
• ජීවිතය යහපත් මාර්ගයට යොමු කරගැනීම.

ආදී ලෙස දක්වමින් කරුණු ඇතුළත් පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(21 පාඩම 130 - 136 පිටු) (ලකුණු 05)

07. i. ගිහි පැවිදි යුතුකම්
ගිහි පැවිදි සම්බන්ධය උදෙසා සිඟාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී ඇති යුතුකම් දක්වමින් අන්‍යෝන්‍ය සබඳතාව මනාව ගොඩ නැගෙන ආකාරයට විස්තර කර ඇති පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(10 වන පාඩම 64 - 66 පිටු)

ii. නීරෝගි බව උතුම් ලාභයයි.
ජීවිතය පවත්වාගෙන යාම සඳහා කායික හා මානසික නීරෝගීතාවයේ වැදගත්කම හා නීරෝගී බව උතුම්ම ලාභයක් වන්නේ කුමන කරුණු නිසා ද යන්න කරුණු දක්වමින් ඉදිරිපත් කර ඇති පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.

iii. සීලයෙහි ත්‍රිකෝටික පාරිශුද්ධිය
ත්‍රිකෝටික පාරිශුද්ධිය හඳුන්වා මාතෘකාවට අදාලව ගොඩ නගා ඇති පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(9 වන පාඩම - 57 පිටුව)

iv. සම්මා ආජීවය
සම්මා ආජීව යන්න හඳුන්වා එම මාතෘකාවට අදාළව ගොනු කර ඇති පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.
(15 පාඩම - 92 පිටුව) (ලකුණු 05 x 02 = 10)